# 07 අප වෙනුවෙන් බෝසතාණන් සය අවුරුද්දක් විඳි දුක්

තමා ම තමාගේ උත්සාහයෙන් උතුම් වූ නිවන සොයා යන අප මහ බෝසතාණන් වහන්සේ මගධ රට සැරිසරමින් ගොස් උරුවෙල් දනව්වේ සේනානි නම් නියම්ගමට සැපත් වූහ. එම නියම්ගම අසලින් ගලාබසින නේරංජනා ගං තෙර වන පෙදෙස සිදුහත් තවුසාණෝ වාසස්ථානකොට ගත්හ. මේ වනවිට **කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම හා අස්සජි** යන, එදා නම් තැබීමට පැමිණි බමුණෝ පස්දෙනා පැවිදි ව සිටියහ. සත්‍යය සොයා යද්දී ඔවුන් ට සිදුහත් බෝසතාණන් හමු විය. එතුමන් හඳුනාගත් ඔවුහු දුෂ්කර ක්‍රියා කිරීමට තීරණය කිරීම ගැන අතිශයින් පැහැදී උන්වහන්සේ ට උපස්ථාන කළෝ ය.

උරුවෙල් දනව්වේ සේනානි ගම ඇසුරු කරමින් ඒ ගමෙන් සිඟාගත් අහරින් එතුමා යැපුණේ ය. වන වැදී තනිව ම සිටින විට තැතිගැනීම් ඇති කරන බියකරු හඬ ඇසෙයි. ඒවා ගැන සොයා බලන විට එක්කෝ සතෙකුගේ නාදයක්, සුළං හැමීමක් හෝ ගස් ඇතිල්ලීමක් වැනි දෙයක් බව පැහැදිලි විය. එයින් බිය දුරු විය. බිය, තැති ගැනීම් ඇතිවන්නේ පව්කම් කළ වැරදි සහිත අයට ය. තමා ළඟ එවැනි වැරදි නැත්නම් කුමට බිය වෙම්දැයි සිතා උන්වහන්සේ මෛත්‍රී භාවනාව වඩන්නට පටන් ගත්හ. එයින් ඉතා බියකරු තැන්වල දී පවා උන්වහන්සේ ට නොබිය ව නොසැලී සිටීමට හැකි විය.

## කෙළෙස් තැවීම

බෝසතාණන් වහන්සේ ට ඊළඟ ගැටලුව වූයේ කාමයන් පිළිබඳ ආශාව, පිපාසය දුරු කිරීම ය. කොතෙක් භාවනා කළත් තෘෂ්ණාව යටපත් කළ නොහැකි වූ තැන උන්වහන්සේ දිව තල්ලට තද කරගෙන දත් සපාගෙන සිතින් සිත මැඩගෙන කෙලෙස් මතුවීම වැළැක්වීමට වෑයම් කළේ ය. මෙසේ දැඩි වීර්යයෙන් භාවනා කරන විට දහඩිය වැගිරෙන්නට විය. එහෙත් වීර්යය දිගට ම පවත්වාගෙන ගියේ ය. සිහිය අවුල් නොවී ය. එනමුත් සිතේ සන්සුන්කමක් ඇති නොවී ය.

## අප්‍රාණක ධ්‍යානය වැඩීම



සිදුහත් තාපසතුමා මුඛයෙන් හා නාසයෙන් ආශ්වාස, ප්‍රශ්වාස කිරීම ද නවතා දැමී ය. හුස්ම ශරීරය තුළ නතර කරගත්තේ ය. එය අප්‍රාණක ධ්‍යානය වැඩීමයි. සිරුර තුළ වූ වාතය දෙකන් සිදුරුවලින් නික්මෙන්නට විය. දෙකන් සිදුරුවලින් හුස්ම පිටවීම නවතා දැමී ය. එවිට වරපටකින් බඳිනා කලෙක මෙන් හිසට තව තවත් වේදනා ඇති විය. මෙසේ මුඛයෙන්, නාසයෙන්, දෙකනින් හුස්ම පිටවීම වැළකුණු විට හිර වූ වාතය නිසා කුසට මහත් වේදනා ඇති විය. ක්‍රමයෙන් මුළු ශරීරයෙහිමත් මහත් වේදනා ඇති විය. දැඩි දැවිල්ලක් දැනෙන්නට විය. මේ නිසා බෝසතාණන් වහන්සේ සිහිසුන්ව සක්මන් මලුවෙහි ඇද වැටුණාහ. මේ දුටු ඇතැම් දෙවි කෙනෙක්, ''සිදුහත් තවුසා මළේ'' යැයි සුදොවුන් රජුට දැන්වූහ. එවිට පියරජතුමා මාගේ පුතු බුදුබව ලබා මළේ ද? බුදුබව නොලබා මළේ ද'' යි ප්‍රශ්න කළේ ය. ''බුදුබව නොලබා මළේ'' යැයි දෙවිවරු කීහ. බුදු බවට පත් නොවී මගේ පුත් කලුරිය නොකරන්නේ'' යැයි රජතුමා දෙවියන්ගේ වදන් නොපිළිගත්තේ ය.

## ආහාර සීමා කිරීම

මුලදී සේනානි නියම්ගම ඇසුරු කොට සිඟා ගත් අහරින් යැපුණු බෝසතාණෝ ක්‍රමයෙන් පිඬු පිණිස යාම අත් හළහ. පවත්තඵල භෝජී වී (අතේ දුරට වැටෙන කොළ, ගෙඩි ආදිය ආහාරයට ගෙන) තමා විසූ වන ලැහැබෙන් සොයාගත හැකි අල වර්ග, පලවැල පමණක් ආහාර කොට ගත්හ. තවත් ටික කලක් යන විට සහමුලින් ම ආහාර ගැනීම නැවැත්වීමට තීරණය කළහ. එය දැනගත් දෙවියෝ එසේ නොකරන ලෙස ඉල්ලා සිටියහ. එවිට බෝසතාණන් වහන්සේ ආහාර ගැනීම සහමුලින් ම නවතනු වෙනුවට ටිකෙන් ටික අඩු කරන්නට පටන් ගත්හ. එයින් සිරුර වැහැරී ගියේ ය.

මෙසේ ආහාර හිඟයෙන් කෘශ වී ගිය ශරීරයෙන් යුතුව නිවන් සුවය අවබෝධ කිරීම පහසු නැත. කම් සැපයෙන් නිවන් (සැප) ලැබීම නොහැකි ය. එසේම (දුෂ්කර ක්‍රියා) දුකින් ද නිවන් සැප ලැබීමට නොහැකි ය. මෙයට මැදුම් පිළිවෙතක් තිබිය යුතු යැයි උන්වහන්සේ නැවතත් පිණ්ඩපාතයෙන් යැපෙන්නට පටන් ගත්හ. ඒ දුටු මෙතෙක් උවටැන් කළ පස්වග තවුසෝ ''ශ්‍රමණ ගෞතමයන් වහන්සේ වීර්යය අත්හැර දැන් නැවත කම්සැප විඳීමට පටන්ගෙන ඇත. ඉතින් මෙතුමා බුදු නොවනු ඇතැයි කියා උන්වහන්සේ තනිකොට බරණැස ඉසිපතනය බලා ගියෝ ය. ටිකෙන් ටික ආහාර ගැනීම නිසා බෝසතාණන් වහන්සේට පහසුවක් දැනෙන්නට විය. දින කීපයක් විවේකයෙන් පසු වූ උන්වහන්සේට පියරජතුමාගේ වප් මඟුල් උළෙලේ දී දඹ ගස් සෙවණේ හිඳගෙන වැඩූ ප්‍රථම ධ්‍යානය ත්, එය වැඩීමට යොදාගත් ආනාපානසති භාවනාව සිහියට ආවේ ය. නිර්වාණයට මග එයම විය යුතු යැයි උන්වහන්සේ තීරණය කළහ.

### ක්‍රියාකාරකම 7.1

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. පස්වග තවුසන් නම් කරන්න.
2. සේනානි නියම්ගම අසළින් ගලා ගිය රමණීය ගංගාව කුමක් ද?
3. ආශ්වාස-ප්‍රශ්වාස නතර කිරීමෙන් වඩන ධ්‍යානය කුමක් ද ?
4. ''සිදුහත් තවුසා මළේ ය'' මෙය කවුරුන් විසින් කාට ප්‍රකාශ කරන ලද්දක් ද?

5. පවත්තඵලභෝජී යනු කුමක් ද?
6. ආහාර සීමා කළ විට සිදුහත් තාපසතුමාගේ ශරීරයට වූ දේ කුමක් ද?
7. පස්වග තවුසන් සිදුහත් තාපසතුමා වෙතින් ඉවත් වූයේ ඇයි?
8. සිදුහත් තාපසතුමා බිය දුරු කර ගැනීම සඳහා වැඩූ භාවනාව කුමක් ද?
9. මෙම වාක්‍ය හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.
   i. තියුණු මුවහත් බුරුමයකින් හිස සිදුරු කරන්නාක් මෙන් සිදුහත් තවුසාට දැනුනේ ආහාර සීමා කළ නිසා ය. (   )
   ii. කාමපිපාසාව බුදුබව ලැබීමට බාධා කරන කරුණක් ය. (   )

## ක්‍රියාකාරකම 7.2

''උත්සාහයෙන් තොරව ජය ලැබිය නොහැක'' යන මාතෘකාවට අනුව රචනයක් ලියන්න.

## පැවරුම

උත්සාහය පිළිබඳ ව සිංහල, පාලි, සංස්කෘත භාෂාවල හා ත්‍රිපිටක පොත්වල සඳහන් විවිධ ආදර්ශපාඨ රැස් කොට කුඩා පොතක් නිර්මාණය කරන්න.

### ජීවිතයට ඔවදනක්

''අත්තනා කුරුතෙ ලක්ඛිං
අලක්ඛිං කුරුතත්තනා''

තමාගෙ භාග්‍යයත් අභාග්‍යයත්
සලසා ගන්නේ තමාම ය.